**ශීර්ෂ 138 - දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| ශීර්ෂ | දෙපාර්තමේන්තුව |
|---|---|
| 220 | ආයුර්වේද දෙපාර්තමේන්තුව |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| **ශීර්ෂය** | **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය** |
|---|---|---|
| 138 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 2015 ජුලි 02 |
| 220 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 2015 ජුලි 09 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. **ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මූළ ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,868.56 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,627.70 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.මිලියන 72.42 ක් හා රු.මිලියන 168.44 ක් හෙවත් සියයට 13.90 ක් හා සියයට 12.49 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ශීර්ෂ** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 138 | 521.00 | 448.58 | 72.42 | 13.90 |
| 220 | 1,347.56 | 1,179.12 | 168.44 | 12.49 |
| එකතුව | **1,868.56** | **1,627.70** | **240.86** | **12.89** |

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 13801 | 13.00 | 9.59 | 4.00 | 6.97 | 36.00 | 23.74 |
| 22001 | 30.00 | 29.43 | 21.00 | 28.15 | 170.00 | 78.52 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 23.31 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 6000/0000/00/0015/0050/000 | 0.64 |
| ආයුර්වේද දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0101/000 | 22.67 |
| | | 23.31 |

**2.4 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ හා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා වූ ඡේදවල දක්වා ඇත.

**3. ශීර්ෂය138 - දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**3.2 විගණන විමසුම්වලට පිළිතුරුදීම**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 07 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 04 කට 2015 ජූලි 03 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**3.3 විසර්ජන ගිණුම**

**3.3.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයකට සළසා තිබුණු රු.8,835,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 28 කට අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ත් සියයට 98 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 13801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු1,295,374 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) අමාත්‍යාංශය විසින් ණය ගෙවීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර රු.416,490 ක ණය ගෙවා තිබුණි

(ඇ) 2005 ජූලි 15 දින ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකු විසින් ලබාගත් ණය ශේෂවල එකතුව රු.288,618 ක් වී තිබුණි. ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1:7 වගන්තිය ප්‍රකාරව එම ණය ලිපිගොනුව අමාත්‍යාංශයේ භාරයේ තබා ගත යුතු වුවත්, එම ණය ලිපිගොණුව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම නිලධාරියාගේ ණය ශේෂ නිරවුල් කර නොතිබුණු අතර වසර 09 ක පමණ කාලයක් ගත වී තිබුණත්, අමාත්‍යාංශය විසින් එම ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් තිදෙනෙකුගේ එකතුව රු.129,499 ක ණය ශේෂ ඔවුන්ගේ මරණ පාරිතෝෂිකයෙන් හෝ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2014 වර්ෂයේදී ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 06 දෙනෙකුගේ එකතුව රු.541,545 ක ණය ශේෂ මාසික ගිණුම් සාරාංශ මගින් නිරවුල් කර තිබුණත්, ඊට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.5.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 3.5.2 අභ්‍යන්තර විගණනය

2014 වර්ෂය සඳහා අමාත්‍යාංශයට අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර තිබුණු අතර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. නිලධාරීන් දෙදෙනකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකය විසින් සමාලෝචිත වර්ෂය සඳහා එක් අභ්‍යන්තර විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබුණි.

### 3.5.3 විගණන හා කළමනාකරණ කමිටුව

සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවත්, රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි.

### 3.6 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ හෝමියෝපති රෝහල් පරිශ්‍රය තුළ ඇති විද්‍යාගාරයට, මුළුතැන්ගෙයට සහ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයට වෙන්කර ඇති ගොඩනැගිලි 03 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ii) භාණ්ඩ වර්ග 43 ක් අබලන්වීම හේතුවෙන් භාවිතයෙන් ඉවත් කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් සුදුස්සක් කර ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2015 ජුනි 24 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**(ii)** ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සඳහන් මුද්‍රණ යන්ත්‍රයක් සහ විදුලි කේතලයක් භෞතිකව හෝමියෝපති රෝහලේ නොතිබුණි.

(iii) හෝමියෝපති රෝහල් කාර්යාල පරිශ්‍රයේ සවිකර තිබුණු වායු සමීකරණ යන්ත්‍ර 5 ක් 2015 මාර්තු 15 දින වන විට අක්‍රීයව පැවති අතර ඒවා අළුත්වැඩියා කර ක්‍රියා කරවීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**-------------------------------------------**

අමාත්‍යාංශය සතු ලොරි රථයක් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත 2013 ජුනි 2 දින මුදාහැර තිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

**--------------------------**

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 01 කට අඩු කාලයක සිට පැවැත එන රු.3,368,929 ක බැරකම් පැවැතුණි.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 115 යටතේ අනුමැතිය ලබා නොගෙන රු.669,838 ක පෙර වර්ෂ බැදීම් සඳහා ගෙවීම් කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවන ලද රු.120,036 ක වියදම් ඩී.ජී.එස්. ඒ. (i) ආකෘතියෙහි බැරකම් යටතේ දක්වා නොතිබුණි.

(iii) වැය විෂයයන් 6 කට සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.515,999 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 3.7 අනුකූල නොවීම්

**-----------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| XII වන පරිච්ඡේදයේ 35.1 වගන්තිය | හෝමියෝපති රෝහලේ සමහර නිලධාරීන් පැය 1 ½ ක කාලය ඉක්මවා කෙටි නිවාඩු ලබා ගෙන තිබුණි. කෙටි නිවාඩු කාලය ඉක්මවා ඇති විට දින ½ ක නිවාඩුවක් අනුමත කළ පසු ලබා ගත යුතු වුවත්, එසේ කෙටි නිවාඩු ඉක්මවීම් 03 කට දින ½ බැගින් නිවාඩු ලබා ගෙන තිබුණි. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

**------------------------------**

| | | |
|---|---|---|
| (i) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සංචිත වාහන 11 ක් සම්බන්ධයෙන් මාස 06 කට වරක් ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ii) | 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92(1) දරන චක්‍රලේඛය. | චක්‍රලේඛයේ විස්තර කර ඇති වාහන ගණනයකට අයත් නොවන සංචිත වාහනයක රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. |

**3.8 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**-------------------------------------------------------**

පෝෂණ මන්දිරය වටා පස් පිරවීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරිය විසින් පිළියෙල කර තිබුණු ඇස්තමේන්තුව අනුව එහි පිරිවැය රු.341,941 ක් වී තිබුණි. අතිරේක ලේකම් සංවර්ධනගේ 2014 ජූලි 02 දිනැති අංක 02/01/65-1 දරන ලිපිය මගින් ලංසු කැඳවීමකින් තොරව පෝෂණ මන්දිරය අවට පස් පුරවා සකස් කරදෙන ලෙස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත දන්වා තිබුණු අතර ඉංජිනේරු සංස්ථාව විසින් ඒ සඳහා රු.863,756 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. 2014 සැප්තැම්බර් 12 දිනැති අංක 02/01/65 – 1 දරන අධ්‍යක්ෂ (සංවර්ධන) ගේ ලිපිය මගින් පෝෂණ මන්දිරය වටා පස් පිරවීමේ කාර්යය රු.125,000 කට ග්‍රාම සංවර්ධන සමිතියකට බාරදී තිබුණි. අදාල කාර්ය ඉටු කිරිම වෙනුවෙන් අමාත්‍යාංශය විසින් ග්‍රාම සංවර්ධන සමිතිය වෙත රු.87,475 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් පෝෂණ මන්දිරය වටා පස් පිරවීම සඳහා ලංසු කැඳවූ බව තහවුරු කිරීමට අවශ්‍ය තොරතුරු ලිපිගොනුවේ නොතිබුණි.

(ආ) 2012 ජනවාරි 05 දිනැති අංක PFD/PMD/Clari/11/02 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදයට පටහැනිව ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයකින් තොරව පෝෂණ මන්දිරය වටා පස් පිරවීමේ කාර්යය රු.125,000 කට ග්‍රාම සංවර්ධන සමිතියකට බාරදී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තු ඇස්තමේන්තුව රු.341,941 ක්ද, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ඇස්තමේන්තුව රු.863,750 ක් වී තිබුණත්, රු.125,000 කට එම කොන්ත්‍රාත්තුව පැවරීම සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක විචලතාවන් සිදු වී තිබුණත්, ඒ පිළිබඳව විශ්ලේෂණය කිරිමක් සිදු කළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) මෙම පස් පිරවීමේ කාර්ය ඉටු කිරීමේදී බොරැල්ල රෝහල් භූමියෙන්ද පස් ලබාගෙන තිබුණු බවට පැමිණිලි ලැබී ඇති නිසා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදලින් සියයට 70 ක් පමණක් ගෙවන ලෙස 2014 දෙසැම්බර් 24 දිනැති ලිපියෙන් ඉංජිනේරු සහකාරවරයා කර තිබුණු දැන්වීම අනුව ගෙවීම් කර තිබුණි.

(ඉ) පෝෂණ මන්දිරය වටා පස් පිරවීමට බොරැල්ල රෝහලෙන් පස් කොපමණ ප්‍රමාණයක් ලබා ගන්නේද යන්න ලිඛිතව තහවුරු කර ගැනීමට ලිපිගොනු පරීක්ෂාවේදී නොහැකි විය. එසේම රෝහල් භූමියෙන් පස් ඉවත් කර ගැනීමට අනුමැතියද ලබාගෙන නොතිබුණි

(ඊ) බොරැල්ල රෝහල් භූමියෙන් ලබාගත් පස් ප්‍රමාණය නිශ්චිතව නොදැන ඒ වෙනුවෙන් රු.37,525ක් හෙවත් මුළු කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 30 ක ප්‍රමාණයක් අඩුකර ගෙවීමට තීරණය කිරීමේදී එම ප්‍රමාණය ගණනය කළ ආකාරය පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(උ) මෙම කොන්ත්‍රාත්කරු විසින් බිල්පත් ඉදිරිපත් කරන විට එම කාර්යයට යෙදූ පස් ප්‍රමාණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර ගැටළුකාරී තත්ත්වයක තිබුණු උක්ත කාර්යය පිළිබඳ අමාත්‍යාංශය විසින් නිසි අවධානය යොමු නොකර රු.87,475ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

**3.9 කාර්යසාධනය**

---------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ

(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

-----------------------------------------------------

අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) රාගම වැලිසර හෝමියෝපති රෝහල් භූමියේ රු.55,000,000 ක් වැය කර ඉදිකරනු ලබන නේවාසිකාගාර ගොඩනැගිල්ල 2014 දෙසැම්බර් 31 දින වන විට වැඩ අවසන් කර භාරදිය යුතු වුවද, 2015 ජුනි 25 දින වන විටත් එහි වැඩ අවසන් කර භාර දී නොතිබුණි.

(ii) රාගම වැලිසර හෝමියෝපති රෝහල වටා වැටක් රු.10,000,000 ක් වැය කර ඉදිකර 2014 දෙසැම්බර් මාසයේදි අවසන් කර භාරදිය යුතු වුවද, එම කාර්ය 2014 දෙසැම්බර් 31 දින වන විටත් ඉටුකර නොතිබුණි.

(iii) 2014 ක්‍රියාකාරී සැලැස්මට අනුව ගම්මාන 03 ක් තෝරාගෙන තරුණ ඔසු ගොවි ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණද, 2014 වර්ෂයේදී ගම්මාන දෙකක් පමණක් තෝරාගෙන තිබුණි. එසේ තෝරාගත් එක් ගම්මානයක කොටසක දැනටමත් ගිරාඳුරු කෝට්ටෙ ඔසු උයන පවත්වා ගෙන යමින් පැවැතුණි.

(iv) 2014 දෙසැම්බර් මාසය වන විට ඔසු වගාකර නෙලීමට සැලසුම්කර තිබුණද, 2014 දෙසැම්බර් 31 දින වන විට ඔසු සිටුවීම හෝ කර නොතිබුණි.

(v) 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සංරක්ෂණ සභා නගා සිටුවීමේ ව්‍යාපෘති ඇගයීම සඳහා ඇගයීම් කමිටුවක් පත් කිරීමට සැලැසුම් කර තිබුණු නමුත් එවැනි කමිටුවක් 2014 දෙසැම්බර් 31 දින වන විටත් පත්කර නොතිබුණි.

(vi) සංරක්ෂණ සභා විසින් තෙල් සිඳීමේ යන්ත්‍ර හා ඖෂධ කුඩු කිරීමේ යන්ත්‍ර 109 ක් ඉල්ලීම් කර තිබුණද 2014 වර්ෂයේදී යන්ත්‍ර 32 ක් පමණක් ලබාදී තිබුණි.

**(ආ) මාර්ග සංවර්ධන කටයුතු හේතුවෙන් පෝෂණ මන්දිරය ඉවත් කිරීම**

දේශීය ආහාර පාන ප්‍රචලිත කිරීම තුළින් ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහල නැංවීමේ අරමුණින් රු.300,000 ක් වැයකර මැදවච්චිය ප්‍රදේශය ඉදිකරන ලද පෝෂණ මන්දිරය මාර්ග සංවර්ධන කටයුතුවලදී ඉවත්කර තිබුණි. ඒ සඳහා ලද වන්දි මුදල් සම්බන්ධව හා මාර්ග සංවර්ධන කටයුතුවලින් පසුව නැවත එම මන්දිරය ඉදි නොකිරීම සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) ජංගම අලෙවි රථ ලබාදීමේ වැඩ සටහන**

දේශීය ආහාර ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් අමාත්‍යාංශය විසින් 2013 හා 2014 වර්ෂවල පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව ඒකකයක වටිනාකම රු.94,500 ක් වූ ජංගම අලෙවි රථ 10 ක් ප්‍රතිලාභීන් වෙත ලබා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) අලෙවි රථ ලබාගත් ප්‍රතිලාභීන් තෝරාගත් පදනම විගණනයට ඉදිරිපත් කළ ලිපිගොණුවලින් අනාවරණය කර ගැනීමට නොහැකි විය.

(ii) ජංගම අලෙවි රථ ලබාගත් එක් ප්‍රතිලාභියෙකුගේ පමණක් එළඹ තිබුණු ගිවිසුම ලිපිගොනුවේ තිබුණු අතර අනෙක් ප්‍රතිලාභීන් 09 දෙනා විසින් එළඹ තිබුණු ගිවිසුම් ලිපිගොණුවල නොතිබුණි.

(iii) ජංගම අලෙවි රථ 02ක් ලබාගත් ප්‍රතිලාභීන් දෙදෙනෙකු විසින් තම අලෙවි රථ දෙක වෙනත් පුද්ගලයන් දෙදෙනෙකුට භාරදී තිබුණි.

(iv) ජංගම අලෙවි රථ 02ක් ලබාගත් ප්‍රතිලාභීන් දෙදෙනෙකු විසින් අරමුණට අනුකූලව කටයුතු නොකර එම රථ නිෂ්ක්‍රීයව රඳවාගෙන තිබුණි.

**(ඇ) හෙල වෙද ගෙවල් වැඩසටහන**

**-------------------------------**

හෙල වෙද ගෙවල් වැඩසටහන සම්බන්ධායන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2011 වර්ෂයේදී මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අනුව ඉදිකරන ලද ගොඩනැගිලි වෙදගෙවල් සඳහාම යොදාගැනීමට අදාල දෙපාර්ශවය අතර ගිවිසුම්වලට එළඹීමට නිර්දේශ කර තිබුණද, එකතුව රු.40,933,388 ක් වැය කර ඉදිකළ වෙද ගෙවල් 42 ක සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ii) 2014 අගෝස්තු මාසයේදී ප්‍රාදේශීය ලේකම්වරු මාර්ගයෙන් හෙද වෙද ගෙවල්වල වර්තමාන ප්‍රගතිය පිළිබඳව විමසීමක් කර තිබුණු අතර, එසේ ප්‍රගතිය කැඳවූ හෙල වෙද ගෙවල් 42 න් එකතුව රු.13,017,857 ක් වැය කර ඉදිකළ හෙල වෙද ගෙවල් 13 ක ප්‍රගතිය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 2014 මාර්තු මාසයේදී ප්‍රාදේශීය ලේකම්වරු මාර්ගයෙන් වෙදගෙවල්වල වර්තමාන ප්‍රගතිය කැඳවීමේදී එකතුව රු.5,470,556 ක් වැය කර ඉදිකළ හෙද වෙද ගෙවල් 07 ක තොරතුරු කැඳවා නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු.2,007,150 ක වියදමින් ඉදිකළ හෙද ගෙවල් 02 ක් ක්‍රියාත්මක වී නොතිබුණි.

(v) අමාත්‍යාංශය විසින් රජයේ මුදල් වැයකර ඉදිකර තිබුණු උක්ත ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය පිළිබඳව ලිපියක් මගින් ලේකම් (සංවර්ධන) විසින් විමසා

තිබුණු අතර ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වා නොතිබුණු හෙද වෙද ගෙවල් පිළිබඳව ප්‍රමාණවත් මැදිහත්වීමක් සිදුකර නොතිබුණි.

**(ඉ) ඔසු උයන්**

-----------

අමාත්‍යාංශය යටතේ පවතින ඔසු උයන් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) පර්යේෂණ ඔසු උයන් නඩත්තු කිරීම හා ප්‍රවර්ධනය කිරීම අමාත්‍යාංශයේ කාර්යයක් වුවද, අමාත්‍යාංශය යටතේ ඇති ඔසු උයන් 02 ක (වෙදගම ඔසු උයන අක්කර 44, මැදිරිගිරිය ඔසු උයන අක්කර 25) හා දෙපාර්තමේන්තුව යටතේ පවතින ඔසු උයන් 05 ක (නීලබැම්ම අක්කර 25, මැදවච්චිය දංගොල්ල අක්කර 50, පදවිය ඔසු උයන අක්කර 25, හිවල් කඳුර අක්කර 100, පීල්ල අබන්පොල අක්කර 69) වල් බිහිවී පැවැති අතර නඩත්තු කටයුතු සිදුකර නොතිබුණි.

(ii) ඔසු උයන්වල ඉඩම් පවරා ගැනීමේ ගැටලු පැවතුණි.

(iii) ඔසු උයන්වලින් ප්‍රමාණවත් නිෂ්පාදනයක් සිදුනොකිරීම හේතුවෙන් ආයුර්වේද ඖෂධ සංස්ථාවට හා ආයුර්වේද දෙපාර්තමේන්තුවට අමු ඖෂධ බාහිර ආයතනවලින් ලබා ගැනීමට සිදුවී තිබුණි.

**(ඈ) සැලැසුම් කිරීම**

----------------

අමාත්‍යාංශයේ 2012–2016 වර්ෂ සඳහා සකස් කර තිබුණු සංයුක්ත සැලැස්මේ, හෝමියෝපති රෝහල් භූමියේ ඉදිකරන නේවාසිකාගාර සංකීර්ණය සහ හෝමියෝපති වෛද්‍ය සභාවේ පරිපාලන ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම යන ක්‍රියාකාරකම් ඇතුළත් කර නොතිබූ නමුත්, 2014 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ එම ක්‍රියාකාරකම් ඇතුළත් කර තිබූ අතර භෞතිකව ද එම කටයුතු ඉටු කර තිබුණි.

## 3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

-------------------------------------

අමාත්‍යාංශයේ බැංකු ගිණුම සම්බන්ධයෙන් වූ 2014 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) බැංකු සැසඳුම් ප්‍රකාශයේ වූ ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව මාස 6 කට වැඩි හා වර්ෂයකට අඩු නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොවූ එකතුව රු.21,971 ක්වූ චෙක්පත් 3 ක් සම්බන්දයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශයේ සඳහන් කර තිබුණු රු.98,942 ක හඳුනා නොගත් ලැබීම්වලින් 2015 ජනවාරි මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදීද එකතුව රු.95,900 ක් වූ චෙක්පත් හඳුනා ගෙන නොතිබුණි.

## 3.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ජල පෙරන 6 ක් රු.87,000 කට මිලදී ගෙන තිබුණි. එක් ආයතනයක් විසින් ජල පෙරන 05 ක් හෝ ඊට වැඩියෙන් මිලදී ගැනීමේදී එකක් රු.14,000 බැගින් සඳහන් කර ලංසු ඉදිරිපත් කර තිබුණත්, අමාත්‍යාංශය විසින් එකක් රු.14,500 බැගින් ලංසු ඉදිරිපත් කර තිබුණු වෙනත් ආයතනයකින් රු.87,000 ක් ගෙවා ජල පෙරන 06 ක් මිලදී ගෙන තිබුණි. ඒ අනුව රු.3,000 ක මූල්‍යමය අලාභයක් රජයට සිදු වී තිබුණි.

(ආ) 2012 ජනවාරි 10 දිනැති අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාවට අනුව මාසයකට ජල බෝතල් 100 ක අවශ්‍යතාවය සඳහන් කර තිබුණි. ජල බෝතල් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවා තිබුණි. ඒ අනුව එක් ආයතනයක් විසින් ජල බෝතල් 50 කට වැඩියෙන් මිලදී ගන්නා විට ජල බෝතලයක් රු.165 කට සපයන බව සඳහන් කර තිබුණි. නමුත් අමාත්‍යාංශය විසින් වෙනත් ආයතනයකින් රු.175 බැගින් ජල බෝතල් මිලදී ගෙන තිබුණි.

(ඇ) රියදුරු කාමරයට 2014 ජනවාරි 02 දින ඉල්ලා තිබුණු වතුර බෝතල් මිලදී ගැනීම සඳහා කැඳවූ මිල ගණන් අනුව පෞද්ගලික ආයතනයක් ලීටර 19 ප්‍රමාණයේ ජල බෝතලයක් රු.170 කට ලබාදිය හැකි බව සඳහන් කර තිබුණද, ලීටර 18.9 ප්‍රමාණයේ ජල බෝතලයක් රු.175 බැගින් වෙනත් ආයතනයකින් මිලදී ගෙන තිබුණි.

(ඉ) හෝමියෝපති වෛද්‍ය සභාවෙන් 2012 මැයි මාසයේදී රෝහල වෙත ලැබී තිබූ වර්ග 927 ක පැරණි ඖෂධ බෝතල් 927 ක් විගණිත දිනය වූ 2015 මාර්තු 10 දින වන විටත් ගබඩාවේ පැවැතුණි. 2012 නොවැම්බර් ලෙස කල් ඉකුත් වූ දිනය සටහන් කර තිබුණු ඖෂධ බෝතල් 367 ක් 2015 මාර්තු 10 දින වන විටත් ඉවත් නොකර පැවැතුණි. ඒ අනුව භාවිතා කිරිමට හැකි ඖෂධ නිකුත් කිරිමට හා කල් ඉකුත් වූ හා භාවිතා කළ නොහැකි ඖෂධ ඉවත් කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.12 පාඩු හා හානි**

2013 මැයි 26 දින හෝමියෝපති රෝහලේ තාප්පයෙන් කොටසක් කඩා වැටීම හේතුවෙන් විදුලි පෞද්ගලික සමාගමකට අයත් විදුලි කණුවකට හානි වීම නිසා රු.67,200 ක වන්දියක් ඉල්ලා තිබුණි. මේ පිළිබඳ 2014 ජූනි 05 දිනැති අංක එච්එම්/සී/එම්අයිඑම්/2013/11 දරන විගණන විමසුමෙන්ද පෙන්වා දී තිබුණි. රෝහල් තාප්පයේ කඩා වැටුණු කොටස විගණන දිනය වූ 2015 මාර්තු 10 දින වන විටත් නැවත ඉදිකර නොතිබුණි. තාප්පයේ දැනට ඉතිරිව පවතින කොටස හා අත්තිවාරමද තැනින් තැන ඉරිතලා ඇති බැවින් එය පෞද්ගලික නිවෙස්වලට කඩා වැටීමේ අවදානමක් පවතින බවද විගණනයේදී නිරීක්ෂණය විය.

**3.13 මානව සම්පත් කළමනාකරණය**

(අ) **අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 43 | 36 | 07 |
| (ii) තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (iii) ද්විතියික මට්ටම | 601 | 377 | 224 |
| (iv) ප්‍රාථමික මට්ටම | 56 | 47 | 09 |
| **එකතුව** | **702** | **461** | **241** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 241ක් පිරවීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ආ) **අමාත්‍යාංශයට නීති නිලධාරියකු බඳවා නොගැනීම**

2012 සැප්තැම්බර් 20 දිනැති අංක 01/06/45 දරන ලිපිය මගින් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට නීති නිලධාරියෙකු බඳවා ගැනීමට කළමනාකරණ සේවා අධ්‍යක්ෂක ජනරාල්ගෙන් අනුමැතිය ඉල්ලා තිබුණි. එම ඉල්ලීමට අනුව 2012 ඔක්තෝබර් 02 දිනැති අංක DMS/C2/37/01 (VOL.1) දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ

ලිපියෙන් හා රාජ්‍ය සේවා කොමිසන් සභාවේ 2013 ජූලි 23 දිනැති ලිපියෙන්ද නීති නිලධාරියෙකු බඳවා ගැනීම අනුමත කර තිබුණි. ඒ අනුව මෙම තනතුරට නිලධාරියෙකු බඳවා ගැනීමට රු. 87,360 ක් වැය කර පුවත්පත් තුනක දැන්වීම් පළ කර තිබුණි. 2014 ජනවාරි 17 දින වන විට ඒ සඳහා අයදුම්පත් 21 ක් ලැබී තිබුණත් විගණන දිනය වූ 2015 පෙබරවාරි 05 දින වන විටත් නීති නිලධාරියෙකු බඳවා ගෙන නොතිබුණි.

## 4. ශීර්ෂ 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුව

## 4.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

## 4.2 විගණන විමසුම්වලට පිළිතුරුදීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 16 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 02 කට 2015 ජූලි 03 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගනුදෙනුවල වටිනාකම රු.30,428,558 ක් විය.

## 4.3 විසර්ජන ගිණුම

### 4.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු රු.3,486,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 23 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ත් සියයට 98 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**4.4 පොදු තැන්පත් ගිණුම**

**----------------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.2,451,781ක තැන්පතු 66 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව, තැන්පතු ගිණුමක අවිනිශ්චිතව තබා ගෙන ඇති මුදල්, ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතබා, අවස්ථාවෝචිත පරිදි අදාල ගිණුමට හෝ රජයේ ආදායමට හෝ බැර කළ යුතු වුවත් 2013 හා 2014 වර්ෂ වල ලැබී තිබුණු රු.3,097,500 ක ආදායම් මුදල් 2015 අප්‍රේල් 10 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශය සතු වෑන් රථයක් එකම දින දෙවරක් අනතුරට ලක්වී අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගරාජයට 2014 ජුලි 03 දින රු.49,101 ක් හා 2014 ඔක්තෝබර් 25 දින තවත් රු.49,101 ක් ගෙවූ බව පොදු තැන්පත් ලේඛනයෙහි දක්වා තිබුණි. මේ නිසා 2014 නොවැම්බර් මාසය අවසාන වන විට ගෙවීම් රු.49,101කින් වැඩිපුර දක්වා තිබුණි. විගණනයේදී අනාවරණය කරගත් මෙම සාවද්‍ය ගෙවීම් පිළිබඳව ඊට වගකිවයුතු නිලධාරීන් පිළිබඳව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව සෑම අර්ධ වර්ෂයකම අවසානයේදී, මුදල්රෙගුලාසි 570හි දක්වා ඇති පරිදි, ඉකුත් වූ සියළුම තැන්පතු පිළිබඳව ලැයිස්තු පිළියෙළ කළ යුතු වුවත්, එසේ පිළියෙල කර නොතිබුණි.

(ඉ) 2013 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ලෙජරයේ පැවති රු.28,025 ක තැන්පත් ශේෂ, 2014 වර්ෂයේ ආරම්භක ශේෂයට ගෙන නොතිබුණි.

(ඊ) 2013 දෙසැම්බර් 31 දිනට නොතිබුණු රු.247,504ක තැන්පත් ශේෂ 2014 ජනවාරි 01 දින ශේෂයන් ලෙස පොදු තැන්පත් ගිණුමේ දක්වා තිබුණි.

(උ) 2014 දෙසැම්බර් 31 දින පොදු තැන්පත් ලෙජරයේ තිබුණු වටිනාකම රු.9,500 ක් වූ තැන්පතු ශේෂය දෙපාර්තමේන්තු පොත්වල ශේෂය ට ගෙන නොතිබුණු බව 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ ලැයිස්තුව පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඌ) 2014 වර්ෂයේදී ගෙවා තිබූ රු.103,212 ක තැන්පතු ශේෂ 2014 දෙසැම්බර් 31 දින ශේෂයට ගෙන තිබුණි.

(එ) 2014 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ලෙජරයේ තිබූණු රු.64,053 ක ශේෂයක්, එදිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය ගණනය කිරීමේදී ගෙන නොතිබුණි.

## 4.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 22001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.4,874,045 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05 ට වැඩි කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) නිලධාරින්ට දේපල ණය ප්‍රදානය කිරිමේදී අවලංගු කළ නොහැකි ඇටෝර්නි බලපත්‍ර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එසේ කර නොතිබුණි.

(ඇ) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව, පාලන ගිණුමේ වර්ෂ අවසාන ශේෂය සමඟ සැසඳුම් ප්‍රකාශනයේ තිබුණු රු.667,724 ක වෙනසට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරින්ගෙන් අය විය යුතු රු.2,220,155 ක් වූ ණය ශේෂ 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. මෙම ණය ශේෂ අතුරින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවැත එන එකතුව රු.1,125,664 ක් ණය ශේෂ විය.

(ඉ) 2014 දෙසැම්බර් 31 දින වන විට රු.1,248,230 ක් සේවය හැර ගිය නිලධාරින්ගෙන් අය විය යුතුව තිබුණි. එම ණය ශේෂවලින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවැත එන රු.610,750 ක ණය ශේෂ විය.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට වැඩ තහනම් කරන ලද නිලධාරින්ගෙන් අය කර ගත යුතුව තිබුණු වසර 5ක් ඉක්මවූ ණය ශේෂ රු.201,360 ක් විය. මෙසේ වැඩ තහනම් කරන

ලද නිලධාරි සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසාන වන දිනට විශ්‍රාම ගිය නිලධාරින් 22 ක ගෙන් අය කර ගැනිමට තිබුණු ණය ශේෂවල එකතුව රු.1,008,800 ක් වූ අතර එම ණය ශේෂයෙන් රු.226,600 ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවැත එන ශේෂ විය. විශ්‍රාම ගිය නිලධාරින්ගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අදාල ණය නිරවුල් කර ගැනිමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ඌ) දෙපාර්තමේන්තුව විසින් රු.24,820 ක ණය හිමියන් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණු අතර එම ණය ශේෂයන් පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(එ) ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් 7 දෙනෙකුගෙන් අය විය යුතු රු.203,055 ක ණය ශේෂයෙන් කිසිදු ණය වාරිකයක් 2014 වර්ෂයේදී අයකර ගෙන නොතිබුණි.

(ඒ) ණය ලිපිගොණු පරීක්ෂාවේදී නිලධාරීන් 5 දෙනෙකුගේ ණය කාඩ්පත්වල ආයුර්වේද කොමසාරිස්වරයා වෙනුවට අත්සන් කළ යුතු බලයලත් නිලධාරියා අත්සන් තබා නොතිබුණි.

(ඔ) 2013 වර්ෂයේ අත්තිකාරම් ගිණුමේ දෙවරක් සටහන් වූ රු.70,605 ක ණය මුදල 2014 වර්ෂයේ ද නිවැරදි කර නොතිබුණි.

## 4.6 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 4.6.1 අභ්‍යන්තර විගණනය

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයේ එක් විගණන නිලධාරියෙකු පමණක් සේවයේ යෙදී සිටි අතර සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන විමසුම් 05 ක් පමණ නිකුත් කර තිබුණි. අභ්‍යන්තර විගණන ඒකකය මීට වඩා ශක්තිමත් විම කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණි.

### 4.6.2 විගණන හා කළමනාකරණ කමිටුව

සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්විම් වාර 04 ක් පැවැත්විය යුතු වුවද, රැස්විම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි.

**4.7 වත්කම් කළමනාකරණය**

**--------------------------**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**--------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බොරැල්ල ආයුර්වේද රෝහලට 2011 සැප්තැම්බර් 26 දින රු.6,500,000 ක් වටිනා විකිරණ යන්ත්‍රය 2012 නොවැම්බර් 01 දින සිට 2015 ජූලි 10 දින දක්වා නිෂ්ක්‍රියව පැවතුනි.

(ii) ආයුර්වේද පර්යේෂණායතනයේ තිබෙන සුදු යකඩ අල්මාරිය 2014 වර්ෂයේ සිට ඉන්වෙන්ට්‍රි ගත කර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**-------------------------------------**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර 2015 මාර්තු 17 දිනට ප්‍රථම සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2015 ජුනි 24 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**4.8 අනුකූල නොවීම්**

**-----------------**

**(අ) නීති, රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| ------------------------------------- | ----------- | -------------------- |
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 264 | 1,124,884 | (i) ආයුර්වේද දෙපාර්තුමේන්තුව විසින් 2014 ජුනි, ජුලි හා අගොස්තු මාසවලදී නිලධාරීන් 35 දෙනෙකුට ගෙවූ රු.1,124,884 ක වැටුප් එම නිලධාරීන් ලබා ගත් බවට 2014 ඔක්තෝබර් 31 දින වන විටද අත්සන් කර නොතිබුණි. |
| | 3,127,326 | (ii) තවද සිමාවාසික ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් 71 දෙනෙක් හා පුහුණුවන හෙද නිලධාරීන් 24 දෙදෙනෙකුට 2014 මාර්තු මාසයේදී පිළිවෙලින් රු.2,561,118 ක් හා රු.566,208 ක් වශයෙන් වැටුප් ගෙවා තිබුණත්, එම වැටුප් ලබා ගත් බවට අදාල නිලධාරීන් 2015 මාර්තු 30 දින වන විටත් අත්සන් කර සනාථ කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645 | - | දෙපාර්තමේන්තුවට අයත් වාහන 5 ක දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | මුදල්රෙගුලාසි 1646 | - | වාහන 14 ක ලොග් සටහන් පොත් යාවත්කාලීන කර නොතිබුණි. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| **(i)** | 2012 දෙසැම්බර් 24 දිනැති අංක EST8/ALOWN/05/0059 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | 2014 අප්‍රේල් 29 දිනැති අංක 02/04/01/1/2014 දරන ආයුර්වේද කොමසාරිස්ගේ ලිපිය මගින් කථිකාචාර්යවරිකයගේ පෞද්ගලික වාහනය යොදා ගැනීම රජයට වඩා වාසිදායක බවත්, ඒ සඳහා ඇයගේ පෞද්ගලික වාහනයට සැතපුම් කුලිය ගෙවන ලෙස අනුමත කර තිබියදී පෞද්ගලික කැබ් රථයකට දින 03කට රු.27,929ක කුලියක් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. |
| (ii) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුවට අයත් වාහන 39 ක ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂා කිරීම 2014 ඔක්තෝබර් 27 දින වන විටද සිදු කර නොතිබුණි. |
| **(iii)** | 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92(1) දරන චක්‍රලේඛය. | දෙපාර්තමේන්තුවට අයත් නිලධාරීන්ට වෙන් නොකළ වාහන 05 ක රාජ්‍ය ලාංඡනය විගණන දිනය වූ 2014 ඔක්තෝබර් 28 දින වන විටද යොදා නොතිබුණි. |

**(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | |
|---|---|
| 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364(3) දරන චක්‍රලේඛයේ 5 ඡේදය | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට අනුව 2012 වර්ෂය සඳහා පෞද්ගලික |

| | | | |
|---|---|---|---|
| | | | සමාගමකට ගෙවා තිබුණු රු.709,059 ක් හා 2014 වර්ෂය සඳහා විවිධ ආයතනවලට රු.548,844 ක් වශයෙන් ගෙවා තිබුණු එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු (NBT) වශයෙන් ගෙවා තිබුණු රු.61,602 ක් පිළිබඳ වාර්තා 2014 දෙසැම්බර් 31 දින වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යවා නොතිබුණි. |
| **(ඈ)** | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**<br>**------------------------------** | | |
| (i) | 3.3 මාර්ගෝපදේශය | 2,844,763 | තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව සීමිත මිල ගණන් කැඳවා දෙපාර්තමේන්තුවේ පුස්තකාලය සඳහා 2014 වර්ෂයේදී රු.2,844,763 ක් වැය කර ලීබඩු උපකරණ මිලදී ගෙන තිබුණි. |
| (ii) | 2.8.4 මාර්ගෝපදේශය | | දෙපාර්තමේන්තු තාක්ෂණ ඇගයීම් කමිටුවේ සංයුතිය තුළ මිලදී ගැනීම පිළිබඳව තාක්ෂණික දැනුමක් හා විශේෂඥතාවයක් ඇති අයෙකු හා ප්‍රසම්පාදන පිළිබඳ දැනුම ඇති රේඛීය අමාත්‍යාංශයේ හෝ ප්‍රසම්පාදන අස්ථිත්වයට බාහිර පුද්ගලයෙගෙන් සමන්විත වන පරිදි නිලධාරීන් තිදෙනෙකු වෙනුවට වෛද්‍යවරුන් 3 දෙනෙකුගෙන් සහ පරිපාලන නිලධාරිගෙන් සමන්විත තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත් කර තිබුණි. |

**4.9 කාර්යසාධනය**
-----------------
2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**
------------------------------------------------
දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යයන් ඉටු නොකිරීමේ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) යක්කල ආයුර්වේද රෝහලේ පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරිම.

(ආ) කයිතඩි රෝහල සඳහා නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරිම.

(ඇ) මන්වන්තුඩුව ආයුර්වේද රෝහලේ වාට්ටු සංකීර්ණයේ ඉදිකිරිම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරිම.

(ඈ) ත්‍රිකුණාමලය ආයුර්වේද රෝහල ඉදිකිරිම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම.

(ඉ) හම්බන්තොට ආයුර්වේද රෝහලේ විදුලි ජනක යන්ත්‍රය සඳහා කාමරයක් ඉදිකර අවසන් කිරීම.

(ඊ) හල්දමුල්ල ඔසු උයනේ කාන්තා සේවක විවේකාගාරයේ ඉදිකිරීම

(උ) පට්ටිපොල ඔසු උයනේ මුළුතැන්ගෙය ඉදිකිරීම දෙවන අදියර

**4.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**
-------------------------------------
2014 දෙසැම්බර් මාසය සඳහා වු බැංකු සැසඳුම ප්‍රකාශය වැරදි ආකාරයෙන් සකස් කර ගණකාධිකාරී ගෙවීම් වෙත ඉදිරිපත් කර තිබුණු අතර, අදාල මාණ්ඩලික නිලධාරි විසින් එය පරීක්ෂා කිරීමකින් තොරව අනුමත කර තිබුණි.

**4.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**
--------------------------------
දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ

(අ) බොරැල්ල රෝහලේ අභ්‍යන්තර ඖෂධාලය සඳහා දොරක් සවිකිරීමට රු.34,505 ක ඇස්තමේන්තුවක් සකස් කර මිල ගණන් කැඳවීමකින් තොරව එම කොන්ත්‍රාත්තුව රෝහලේ වෙනත් අළුත්වැඩියාවක් සිදුකරමින් සිටි කොන්ත්‍රාත්කරුවකුට ලබාදී තිබුණි. පසුව එම දොරට ඉහලින් වහලයක් සහ තවත් අත්‍යාවශ්‍ය වෙනස් කිරීම් ඇතුළත් කර රු.64,443 ක ඇස්තමේන්තුවක් මත එම කාර්යය පවරා රු.74,087 ක් ගෙවා තිබුණද, සැලැසුම් කළ පරිදි වහලය ඉදිකර නොතිබුණි.

(ආ) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ බෝනොවන රෝග සඳහා වන පර්යේෂණ ව්‍යාපෘතිය වෙනුවෙන් සළසා තිබුණු රුපියල් මිලියන 300 ප්‍රතිපාදනවලින් දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයට ලැප්ටොප් පරිගණකයක් 2014 ජනවාරි 8 දින මිලදී ගෙන ලබා දී තිබුණි.

(ඇ) තවද, ඉහත සඳහන් ව්‍යාපෘතිය සඳහා උපකරණ මිලදී ගැනීමේදී රු.7,400 ක් වැය කර ස්කෑන් යන්ත්‍ර 04 ක් වෙනුවෙන් පිරිවිතර පිළියෙල කර ලංසු කැඳවා තිබුණත්, රු.475,000 ක් වැය කර ස්කෑන් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි.

## 4.12 අවිධිමත් ගනුදෙනු

-------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ

(අ) බොරැල්ල රෝහලේ රු.549,617ක වියදමකින් සිදුකළ දෙපාර්තමේන්තුවේ අළුත්වැඩියාවක් සඳහා ප්‍රසම්පාදන කමිටුවේ තීරණයකින් තොරව සීමිත මිල ගණන් කැඳවා තිබුණු අතර මිල ගණන් ඇගයීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක්ද පත්කර නොතිබුණි. කොන්ත්‍රාත්කරු විසින් බිල්පත් ඉදිරිපත් කර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු හා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික නිලධාරියෙකු විසින් මැනීම් සිදුකර පිළියෙල කළ ප්‍රමාණ බිල්පත් ද ගොනුවේ නොතිබුණි.

(ආ) මිලියන 300 ව්‍යාපෘතිය යටතේ ආයුර්වේද පර්යේෂණායතනයේ පුස්තකාලයට ලී බඩු උපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2013 ජූලි 18 දිනැති අංක BRIPR/lit/05 දරන ලිපිය ප්‍රකාරව ආයුර්වේද පර්යේෂණායතනයේ පුස්තකාලය නවීකරණය හා සංවර්ධනයට අවශ්‍ය වන පොත්, අල්මාරි, මේස, පුටු, රාක්ක සඳහා එකතුව රු.2,844,763 ක් බෝනොවන රෝග සඳහා වූ පර්යේෂණ ව්‍යාපෘතියේ අරමුදල් භාවිතා කර වැය

කර තිබුණි. එය බෝනොවන රෝග සඳහා වූ පර්යේෂණ ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනි වියදමක් වශයෙන් නිරික්ෂණය විය.

(ii) මෙම සැපයුම්කරු ජාතිය ගොඩනැගීමේ බදු සඳහා ලියාපදිංචි වී ඇති බව තහවුරු කර නොගෙන දෙපාර්තමේන්තුව විසින් ජාතිය ගොඩනැගීමේ බදු වශයෙන් රු.49,908 ක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි.

**(ඇ) ත්‍රිකුණාමලය ආයුර්වේද රෝහලේ පිරිමි වාට්ටුව ඉදිකිරීම**

ත්‍රිකුණාමලය ආයුර්වේද රෝහලේ පිරිමි වාට්ටුව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රථම ගෙවීමේදී නිමකළ වැඩවල වටිනාකම වූ රු.771,571 කින් සියයට 10 ක රඳවා ගැනීම් අඩු කර එකතු කළ අගය මත බදු එකතු කිරීමෙන් ගෙවිය යුතු මුදල රු.777,743 ක් වුවත්, ඒ සඳහා රු.854,901 ක් ගෙවීම නිසා රු.77,158 ක් වැඩිපුර කොන්ත්‍රත්කරුට ගෙවා තිබුණි.

## 4.13 අනාර්ථික ගනුදෙනු

බොරැල්ල ආයුර්වේද රෝහලේ භික්ෂු වාට්ටුවට තනි පියනේ දොරක් සවි කිරීමට රු.47,887 ක ඇස්තමේන්තුව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කර තිබුණද. පූර්ව අනුමැතියෙන් බැහැරව රු.124,465 ක පිරිවැයකින් පියන් දෙකේ දොරක් සවිකර තිබුණි.

## 4.14 කළමනාකරණ දුර්වලතා

දෙපාර්තමේන්තුවේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා අනාවරණය විය.

(අ) 2012 ජූලි 11 දිනැති අංක 02/02/10/02/-07(1) දරන ආයුර්වේද කොමසාරිස්ගේ ලිපිය මගින් 2012 ජූලි 13 දින සිට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට මඩකලපුව-පංචන්තොඩුවාසි ආයුර්වේද වෛද්‍ය නිලධාරියෙකු ස්ථාන මාරු වීම් ලබා දී තිබුණු අතර, ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් මාස 15 ක කාලයකට රු.548,376 ක වැටුප් ගෙවා තිබුණි. දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල් අය කර ගෙන නොතිබුණි. සාවද්‍ය ලෙස වැටුප් ගෙවීම පිළිබඳව ඊට වගකියයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) කොස්සින්න රජමහ විහාරයේ පැවති 2014 වර්ෂයේ හිසතෙල් ගෑමේ රාජ්‍ය උත්සවයට රු.175,000 ක් වැයකර තිබුණි. එම වියදමට ඇතුළත් වූ රු.160,480 ක පිරිවැය වූ පරාල, රිප්ප, ලෑලි හා රු.6,000 ක පිරිවැය වූ රතු වෙල්වට් රෙදි ආපසු දෙපාර්තමේන්තුවට ලබාගත් බවට හෝ නැවත අලෙවි කළ බවට හෝ එම විහාරස්ථානයේ ප්‍රයෝජනයට ලබාදුන් බවට හෝ තහවුරුවක් ඉදිරිපත් කර නොතිබුණි.

## 4.15 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 256 | 222 | 34 |
| (ii) | තෘතියික මට්ටම | 164 | 73 | 91 |
| (iii) | ද්විතියික මට්ටම | 275 | 148 | 127 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 888 | 663 | 25 |
| | **එකතුව** | **1,583** | **1,106** | **477** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 477 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවට අයත් රෝහල්වල අනුමත හා තථ්‍ය වෛද්‍යවරුන් හා හෙදියන් සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| රෝහල | වෛද්‍යවරුන් | | හෙදියන් | |
|---|---|---|---|---|
| | අනුමත | තථ්‍ය | අනුමත | තථ්‍ය |
| බොරැල්ල රෝහල | 115 | 115 | 40 | 30 |
| යක්කල රෝහල | 10 | 14 | 20 | 18 |
| හම්බන්තොට රෝහල | 14 | 10 | 20 | 05 |
| කයිතඩි රෝහල | 09 | 09 | 04 | 01 |

*අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ රහිතව වෛද්‍යවරු ගණනය කර ඇත.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) යක්කල රෝහලේ ආයුර්වේද වෛද්‍යවරු 4 දෙනෙකු අතිරික්තව සිටි අතර හම්බන්තොට රෝහලේ ආයුර්වේද වෛද්‍යවරු 4 දෙනෙකුගේ පුරප්පාඩු තිබුණි.

(ii) ආයුර්වේද රෝහල් 4ක පැවති හෙදි පුරප්පාඩු 30ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(iii) බොරැල්ල සහ ගම්පහ රෝහල් දෙකෙහිම 2013 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරුවල රාජකාරි වැඩ බලන නිලධාරීන් මගින් ආවරණය කර තිබුණි.

(iv) කයිකඩි රෝහලේ 2008 වර්ෂයේ සිටද හම්බන්තොට රෝහලේ 2010 වර්ෂයේ සිටද අධ්‍යක්ෂ හා නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරුවල රාජකාරි වැඩ බලන නිලධාරීන් මගින් ආවරණය කර තිබුණි.